# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 12
NUMBER 10

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

FEBRUARY 10, 2010 පෙබරවාරි මාසය (බුද්ධ වර්ෂ 2553 නවම් මාසය) http://www.lankaheritage.com/lankaviththi/





# දෙවෙනි විජයග්‍රහණය!

♦ සංජය විමලරත්න ශ්‍රීලංකාවේ සිට

**ගි**ය වසරේ මැයි මස **19** වෙනි දින අපේ වීරෝදාර දේශප්‍රේමී සන්නද්ධ හමුදා කුරිරු එල්ටීටීඊ ත්‍රස්තවාදය ශ්‍රීලංකාවෙන් සහමුලින් නැති භංග කර දැමූ ඒ අසිරිමත් කාර්‍යය විස්මිත විජයග්‍රහණය ලෙසින් අප හැඳින් වූ අයුරු අප පාඨකයන්ට මතක ඇත. ඒ ප්‍රථම විජයග්‍රහණයයි. ගිය මස **2010** ජනවාරි **26** වනදා අප රටේ ජනතාව මහත් බහුතරයක් විසින් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා යළිත් රටේ ජනාධිපතිවරයා වශයෙන් ජනපතිවරණයේදී ඡන්දයෙන් තෝරාපත්කර ගනු ලැබීම දෙවන විජයග්‍රහණය වශයෙන් හැඳින්වීම වඩාත් උචිතය.

මෙය බැලූ බැල්මට රාජපක්ෂ ජනාධිපතිවරයා සිය පිළිමල් අපේක්ෂක ජෙනරාල් පොන්-සේකා අභිබවා ලද විසල් දිනුමක් ලෙස පෙනුනත් එය පමණක්ම නොව තවත් ජයග්‍රහණ රැසකට මුල්වන්නකි. ඒවා අතර මෙම ජයග්‍රහණය වනාහි ශ්‍රීලංකාවේ දේශීය හා විදේශීය කුමන්ත්‍රණ කාරයින් රටේ බලය උදුරාගෙන, රට භේද භින්නකර, රට ආපස්සට ගෙනියන්නට හා යළිත් යුද්ධයකට ප්‍රවිෂ්ට කරවන්නට ගත් වෑයම රටේ සාමාන්‍ය ජනතාව විසින් සාමුහිකව එක්වී පරාජය කරනු ලැබීමකි. ( දේශීය හා විදේශීය කොමිස් ඒජන්තවරුන්ට යුද්ධය නිමාවීමත් සමග ආයුධ ආනයන වලින් ලත් ඇමරිකානු ඩොලර් මිලියන ගණනින් නැතිව ගිය හැටි අප අමතක නොකළ යුතුය.)

එසේම බොරු සහ අසත්‍ය ප්‍රචාර ගජබින්න රටපුරා වපුර මින් ගෙනගිය විෂම ප්‍රචාරයන්ට ද මෙම ජයග්‍රහණය කදිම පිළිතුරකි. ඇතැම් පුවත්පත්වල පිටුගණන් මඩ ගසා ලියූ ලිපිද වෙබ් අඩවි වලින් ගෙනගිය නිහීන ප්‍රචාරයන්ද, ජංගම දුරකතනයන්ට එස්. එම්. එස්. මගින් යැවූ අසත්‍ය පණිවුඩ ප්‍රචාරයන්ද පසුගිය සමයේ විශාල වශයෙන් පැතිරුණු අයුරු අපි දුටුවෙමු.

රටේ සියළුම ජනතාව කොටස් වශයෙන් නොබෙදී එකම ජනතාවක් ලෙස දකින්නට අපේක්ෂාකරන දේශීය දේශප්‍රේමී බලවේගයන් ඒකරාශීව නැගීසිටිමින් කොටි ත්‍රස්තවාදීන්ගේ සුන්බුන් යළිත් පණගන්වන්නට උපායයන් යෙදූ විනාශකාරී ප්‍රතිගාමී කොටස් වලට එරෙහිව ලැබූ ජයග්‍රහණයක්ද වන්නේය. නමුත් වඩාත් වැදගත් කරුණ නම් කොටිහිතවාදී දෙමළ පිරිස්වල බහට අවනතව බටහිර බලවේග වන බ්‍රිතාන්‍යය, ඇමරිකාව සහ යුරෝපා සංගමයය එකතුව අප රටට එරෙහිව සහ ශ්‍රීලංකා රජය අස්ථාන කරන්නට ගෙනගිය දුෂ්ට ක්‍රියාකලාපයට නිසි පිළිතුරක් දීමට මේ ජයග්‍රහණය සමත් වීමයි.

එසේම පොන්සේකා කඳවුරේ ආදර්ශ පාඨය වන **විශ්වාසනීය වෙනස** අභිබවා යමින් රාජපක්ෂ කඳවුරේ **සුභ අනාගතයක්** නමැති ආදර්ශ පාඨය කෙරෙහි ජනතා බහුතරයකගේ විශ්වාසය තහවුරුවීමයි.

## ජනපතිවරණය පැවැත්වූ පසුබිම

අපේ රටේ ඉදිරිගමන ක්‍රියාත්මක වෙමින් තිබූ අතර, එය යුද්ධයේ අවසානයත් සමග වඩාත් සීඝ්‍රයෙන් සිදුවන බව පෙනෙන්ට විය. අළුත් මංමාවත් ඉදිවෙමින්, පාරවල් පුළුල්වෙමින්, වාහන තදබදය මගහරවන මින් පෙර නොතිබි ගුවන් පාලම් ඉදිවෙමින්, නව වරායන්, නව ගුවන් තොටුපළවල් සූදානම්වෙමින්, විශාල විදුලි බලාගාර තැනෙමින් වැඩ පිළිවෙලවල් රාශියක් ක්‍රියාත්මක වන ආකාරය කාටත් විවෘතව පෙනෙන්ට විය. මගීන් ප්‍රවාහන පහසුවද, අඛණ්ඩව දවස පුරා නොකැපී ක්‍රියාත්මක වන විදුලිය සහ ජලය සැපයුමද හොඳින් දැනෙන පෙනෙන දේ වීය. එහෙත් මේ කියා මාර්ග යුද්ධයෙන් පසු උදාවූ සාමයේ වර්ධනය තුළින් මතුවන කොන්ත්‍රාත් ලබා මුදල් ගරන්නට බලාපොරොත්තුව සිටි දේශීය හා විදේශීය පෞද්ගලික ව්‍යාපාරික අවස්ථාවාදීන්ගේ ඇහැට අනින කටු මෙන් විය. එසේම තමන්ට මේ කිසිවකට අත දාන්නට නොලැබෙන බවද මෙම විදේශීය බලවේග තැවුල් සහිත සිතින් බලාගෙන සිටියෝය.

අප රජය නව දිශාවන් දෙසට විශ්වාසයෙන් යුතුව සහ සාර්ථක ලෙස යෙමුවූ අතර කොටි ත්‍රස්තවාදයට එරෙහිව අප කළ අරගලයේදී අපේ කටයුතු වලට අකුල් හෙලූ බංකොලොත් බටහිරයන්ගේ පිහිට හෝ උපදෙස් කිසිවක් බලාපොරොත්තු නොවූවාය. අපි අළුත් ලෝක යේ බලවතුන් බවට පත්වෙමින් සිටින චීනය, රුසියාව, ඉන්දියාව, මැලේසියාව හා ලතින් ඇමරිකානු රටවල් හා මිත්‍ර සම්බන්ධතා ගොඩ නගාගන්නට සමත් වීමු. එසේම එකී රටවල් අපට උපකාර අවශ්‍ය වූ අවස්ථාවේ අප සමග වෙසෙමින් නොපැකිල අපට උපකාර කළෝය.

මේ අතර මේ පසුබිමේම කොටි හිතවාදී විෂම දෙමළ ඩයස්පෝරාව තම සුදු මාස්ටර්ලා සමග එක්ව සුපරීක්ෂාකාරීව බලාගෙන සිටියේ අප රටේ ඉදිරිගමන හා දැන් කෙරීගෙන යන වැඩ පිළිවෙල කෙසේ නැවැත්විය හැකිදැයි උපාය මාර්ග ගැන කල්පනා කරමිනි. **වෙනසක් සඳහා ඡන්දය දෙන්න** යන තේමාව


4 වන පිටුව බලන්න →


රැ දු රැ යුගය රැපු නොද බිඳ නිමා කර
අ ළු රැ රටට සුබ අරමුණු ළඟා කර
ත ඹු රැ පිපෙන ලෙස දුටු සඳ දිවා කර
සොඳුරැ ඔහුට යළි හිමිවිය ජනා දර

**Finishing a brutal era bringing closer the pieces torn**
**He lit aspirations in a land once they thought forlorn**
**Just as the lotus open, seeing the approaching sun**
**The masses adored him, so again he handsomely won**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*




ඔබේ මුදල් අදම යවන්න
අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY



විස්තර පිටු අංක 3